// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 1688/13 - 2011 ජනවාරි 12 වැනි බදාදා - 2011.01.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### මධ්‍යම පළාතේ පළාත් සභාව

ආණ්ඩුකාරවරුන් විසින් කරනු ලබන පත්කිරීම්

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 (1) වගන්තිය යටතේ මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර ටිකිරි බණ්ඩා කොබ්බෑකඩුව වන මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2011.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් පත්කිරීම් සිදු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| (i) | එම්. එස්. ප්‍රේමවංශ මහතා ශ්‍රී.ලං.ප.සේ. I | - මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු, සංචාරක, ප්‍රවාහන, ඉඩම්, සමුපකාර සංවර්ධන, වෙළඳ හා වාණිජ, ආහාර සැපයුම් හා බෙදාහැරීමේ කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ හා වෙනත් අමාත්‍යාංශයන් යටතට නෙගැනෙන විෂයන් සම්බන්ධ අමාත්‍යාංශයේ ලේකම්. |
| (ii) | කේ. පී. කරුණාදාස මහතා ශ්‍රී.ලං.ප.සේ. I | - මධ්‍යම පළාතේ කර්මාන්ත, ක්‍රීඩා, කාන්තා කටයුතු, ග්‍රාමීය සංවර්ධන, වතු යටිතල පහසුකම් සංවර්ධන, හින්දු සංස්කෘතික කටයුතු, අධ්‍යාපන (දමිළ) සහ තරුණ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්. |
| (iii) | ඩබ්. බී. ඒකනායක මහතා ශ්‍රී.ලං.ප.සේ. I | - මධ්‍යම පළාතේ මාර්ග සංවර්ධන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම්. |
| (iv) | කේ. කැකුලන්දර මහතා ශ්‍රී.ලං.ප.සේ. I | - මධ්‍යම පළාතේ කෘෂිකර්ම, සුළු වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, ගොවිජන සංවර්ධන, ධීවර සහ පරිසර කටයුතු අමාත්‍යාංශයේ ලේකම්. |
| (v) | ඩබ්. ජේ. පී. එස්. වීරකෝන් මිය ශ්‍රී.ලං.ප.සේ. I | - මධ්‍යම පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන සහ පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ ලේකම්. |

ටිකිරි බණ්ඩා කොබ්බෑකඩුව,
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

2011 ක් වූ ජනවාරි මස 10 වැනි දින,
මහනුවර,
මධ්‍යම පළාතේ ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

01 - 565

1A - PG 001217— 340 (2011/01)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.